**ව්‍යාපාර කමිටු වාර්තාව - කිරිදිඔය ව්‍යාපාරය**
**නේවාසික ව්‍යාපාර කළමනාකරණ කාර්යාලය - ලුණුගම්වෙහෙර**
**2017 සැප්තැම්බර් 26 දින පෙ:ව 9:00**

නිලධාරී සහභාගිත්වය

**වාරිමාර්ග කළමනාකරණ අංශය**

1. ටී. කේ සුනිල් මයා - නේවාසික ව්‍යාපාර කළමනාකරු
2. අයි. එල් කොඩිතුවක්කු මිය - සංවර්ධන නිලධාරී
3. ඩබ්. ඒ සුදර්ශනි මිය - සංවර්ධන නිලධාරී
4. බී. පී ඉනෝකා ජයමාලි මිය - සංවර්ධන නිලධාරී
5. ඒ .පී .පි දමයන්ති මිය - සංවර්ධන නිලධාරී
6. බී සේනාරත්න මයා - සංවර්ධන නිලධාරී
7. ඩබ්ලිවු ඉෂාන් රසික මයා - සංවර්ධන නිලධාරී
8. කේ.ඒ.ඩී.පී දිල්රුක්ෂි මිය - සංවර්ධන නිලධාරී
9 .එන්.ඒ.ඉරෝෂනී සඳමාලි මිය - සංවර්ධන නිලධාරී
10.එච්.එල්.ඩී ප්‍රසන්න මයා - සංවර්ධන නිලධාරී
11.ඒ.පී.කේ ඉන්දික මයා - සංවර්ධන නිලධාරී
12.ජේ.පී.සී ධර්මබන්දු මයා
13.ඩී.එන් නලින් සංජීව මයා

**වාරිමාර්ග දෙපාර්තුමේන්තුව**

1. එන්.වී.පී.පී.පී.ජයවර්ධන මයා - ප්‍රාදේශීය සහකාර

**ගොවි නියෝජිතයන්**

01 .එස්. ඩී ජේමදාස මයා - සභාපති ඩීසී 13 බැමිණියාව
02. එස්. ජාලියගොඩ මයා - සභාපති යෝධවැව වලදොර ජනතා ගොවි සංවිධානය
03. එස්. ඒ සිරිපාල මයා - සභාපති ඩීසී ඩීසී 05 ගොවි සංවිධානය
04. ඒ. බී. ඒ මුණසිංහ මයා - සභාපති ඩී සී 1-2 ගොවි සංවිධානය
05 .ඩී. අන්දරවීර මයා - සභාපති බදගිරිය අංක 02 ගොවි සංවිධානය
06. ඒ. කේ ආරියතිලක මයා - සභාපති දෙබරවැව පුබුදු ගොවි සංවිධානය
07. ටී. එම් සදුරුදීන් මයා - සභාපති ද-ඉ ඩීසී 8-9 ගොවි සංවිධානය
08. ටී. පී සෙනෙවිරත්න මයා - සභාපති ද-ඉ යාය 05 ඩීසී 1-2-7 ගොවි සංවිධානය
09. ගුණදාස ජයසේකර මයා - සභාපති නෙලුම් ගොවි සංවිධානය
10. ටී. එච් මුණසිංහ මයා - ලේකම් යෝධවැව බණ්ඩරවත්ත බෙදුම් ඇළ ගොවි සංවිධා
11. එච්. කේ ජේමරත්න මයා - සභාපති වීරවිල වැව ඩීසී 02 රුහුණු ගොවි සංවිධානය
12. ධර්මසිරි මුණසිංහ මයා - ලේකම් බදගිරිය අංක 03 ගොවි සංවිධානය
13. සුගතදාස මුතුකුමාරණ මයා - සභාපති යාය 6 ඩීසී 01 ගොවි සංවිධානය
14. එන්. ටී ජයලත් මයා - සභාපති ද-ඉ ඩීසී 03 ගොවි සංවිධානය
15 .කේ. ජී ජයදාස මයා - සභාපති දෙබරහැළ එක්සත් ගොවි සංවිධානය
16. එම්. ඒ චන්ද්‍රසේන මයා - ලේකම් ද-ඉ ඩීසී 6-7 ගජබා ගොවි සංවිධානය
17. ඊ ඒ විමලරත්න මයා - ලේකම් වීරවිල වැව ඩීසී 08 ඉක්කපල්ලම ගොවි සංවිධානය
18 .ඩබ්. එල් සෝමසිරි මයා - ලේකම් වීරවිලවැව ඩීසී 9-10-11 ගොවි සංවිධානය
19. කරුණාදාස ජයසිංහ මයා - ජල පාලක තිස්ස වැව ඩීසී 04- 05 ගොවි සංවිධානය
20 .පී. පී සෝමවංශ මයා - සභාපති තිස්ස වැව සුහද එක්සත් ගොවි සංවිධානය
21. එස්. පී සිරිසේන මයා - සභාපති සභාපති ද-ඉ යාය 02 ඩීසී 8-9 ගොවි සංවිධානය
22. එච්. පී කරුණාසේන මයා - සභාපති සුහද ගොවි සංවිධානය
23. එස්. පී රංජිත් මයා - සභාපති වීරවිල වැව ඩීසී 04 සුහද ගොවි සංවිධානය
24 .අතුල ගලප්පත්ති මයා - ලේකම් වීරවිල වැව ඩීසී 05 ගොවි සංවිධානය
25. ප්‍රේමචන්ද්‍ර රදම්පල මයා - සභාපති ද-ඉ ඩීසී 3-4-5 ගොවි සංවිධානය
26. උපාලි අරඹගේ මයා - සභාපති වීරවිල වැව ඩීසී 6-7 ගොවි සංවිධානය
27. එච්. කේ සරත් සිරිවිජය මයා - ලේකම් වීරවිල වැව ඩීසී 01 එකමුතු ගොවි සංවිධානය
28. ඊ .එම් විමලසිරි මයා - සභාපති වම් ඉවුර යාය 01 ඩීසී 6-7 ගොවි සංවිධානය
29 .ටී. එම් මහින්ද මයා - සභාපති පන්නෙගමුව ප්‍රගති ගොවි සංවිධානය
30. සරත් ලියනගම මයා - සභාපති යෝධවැව ගොඩදොර ඩීසී 01 ගොවි සංවිධානය
31 .එච් .එච් ප්‍රියසේන මයා - සභාපති යොධවැව රණකෙළිය ගොවි සංවිධානය

32. එච්. ඩබ් පීනදාස මයා - ලේකම් ඩීසී 11-12-13 ගොවි සංවිධානය
33. ඩී. පී ධම්මිකා නිශාන්ති මිය - භාණ්ඩාගාරික වම් ඉවුර ඩීසී 6-7-8 ගොවි සංවිධානය
34. මාලා කාන්ති අබේකෝන් මිය - ලේකම් යාය 01 ඩීසී 02 ගොවි සංවිධානය
35.පී. එම් මුනිදාස මයා - ලේකම් යෝධවැව දොරාවයාය ගොවි සංවිධානය
37. ඊ. ඩබ්. පී කරුණාදාස මයා - භාණ්ඩාගාරික යෝධවැව දොරාවයාය ගොවි සංවිධානය

ආගම සිහිකිරීමෙන් අනතුරුව නේවාසික ව්‍යාපාර කළමනාකාරතුමා විසින් පැමිණි ගොවි නියෝජිතයන් සහ රජයේ නිලධාරීන් පිලිගන්නා ලදි. ඉන්පසු මෙදින සාකච්ඡාවට ගන්නා විශේෂ කරුණු ලෙස
01 ජාතික ඒකාබද්ධ ගොවි සංවිධානය සහ වාරිමාර්ග කළමණාකරන අංශය සංවිධානයෙන් දෙවන වරට පවත්වනු ලබන සිරි දළදා යල් රන් අස්වනු පූජාව
02 ඔක්තොම්බර් 10 දින සිට ඔක්තොම්බර් 13 දින දක්වා ගොවි අධ්‍යයන චාරිකාව
03 ඉදිරි මාස් කන්නය සඳහා කන්න රැස්වීම් දින නියම කර ගැනීම
04 වාරිමාර්ග ගොවිජනසේවා කෘෂිකර්ම යන විෂයන් සාකච්ඡාවට ගන්නා බව පැවසීය.

**පසුගිය වාර්තාව සමාලෝචනය:-**

උපාලි අරඹගේ මහතා සඳහන් කළේ වාර්ථාවේ සඳහන් වී ඇති අතුරු කන්නය සඳහා මුං බීජ ලබා දීම යන්න මුං බීජ ලබා නොදීම ලෙස නිවැරදි විය යුතු බව සඳහන් කරන ලදි.
ඉන් පසු වාර්ථාව සභා සම්මත කරන ලද්දේ තිස්ස වැව සුහද එක්සත් ගො:සං සභාපති පී. පී සෝමවංශ මහතාගේ සහ දකුණු ඉවුර යාය 02 ඩීසී 8/9 ගො:සං සභාපති එච්. පී සිරිසේන මහතාගේ යෝජනා ස්ථිරත්වයෙනි.

**<u>ආයතන සංවර්ධනය</u>**

ව්‍යාපෘති කළමනාකරනතුමා අදහස් දක්වමින් වරිමාර්ග කළමනාකරණ අංශ මුලස්ථානයේ කාර්යාලයෙන් දැනුවත් කර එවා ඇති ලිපියට අනුව මුලු රටේම ව්‍යාපාර කමිටු අතරින් එක් කමිටුවකින් හොදම ගොවි සංවිධාන 5ක් තෝරා ගන්නා තරගයක් පැවැත්වෙන බවත් එසේ තෝරා ගන්නේ ව්‍යාපාර කළමණාකරන මුලස්ථානයෙන් එවා ඇති උපදෙස් මාලාවට අදාළව බවත් එක් ව්‍යාපාර කමිටුවකින් ගොවි සංවිධාන 5ක් තෝරාගෙන ඉන්පසු තෝරාගත් සියලුම ගොවි සංවිධාන අතරින් හොදම ගොවි සංවිධාන තෝරාගෙන එහි ගොවි නියෝජිතයින් කිහිප දෙනෙකු විදේශ සංචාරයක් සඳහා සහභාගී කරවන බවත් 2016 වර්ෂයට පෙර කරන ලද ක්‍රියාකාරකම් අනුව තෝරා ගැනීම සිදු කරන බවත් දැනුම් දෙමින් දීර්ඝ විස්තරයක් කරමින් සෑම ගොවි සංවිධානයකට එවා ඇති නිර්නායකවල පිටපතක් ලබා දෙන බවත් පැවසීය.වම් ඉවුර ,දකුණු ඉවුර ,බදගිරිය පුනරුත්තාපන වැඩසටහන් වලදී හොදින්ම එම වැඩ කොටස් කරන ලද අයටත් විදේශ සංචාර හිමිවන බවත් සඳහන් කළේය.
ව්‍යාපාරයේ දැනට දුර්වල ගොවි සංවිධාන ලෙස වීරවිල වැව කෝන්වැලෑන සුහද ගොවි සංවිධානය, තෙලුල්ල ගොවි සංවිධානය ,තිස්ස වැව ඩීසී 4-5 ගොවි සංවිධානය, වම් ඉවුර යාය 02 ඩීසී 3-4 ගොවි සංවිධානය, දකුණු ඉවුර යාය 02 ඩීසී 3-4-5 ගොවි සංවිධානය ලෙස සඳහන් කරන ලදි.එම ගොවි සංවිධාන ක්‍රියාකාරීත්වය පිළිබඳව අදාළ ගොවි සංවිධාන දැනුවත් කරන ලෙස සංවර්ධන නිළධාරීන්ට වගකීම පවරන ලදි.
ඔක්තොම්බර් මාසය තුළ සියලුම ගොවි සංවිධානවල 2017-2018 මාස් කන්නයට අදාළව මහාසභා රැස්වීම් පැවැත්විය යුතු බවත් ඒ සඳහා සංවර්ධන නිළධාරීන් සමග සාකච්ඡා කර දින ලබා ගතයුතු බවත් සඳහන් කරන ලදි.

**ආයතන සංවර්ධනයට අදාළ ගැටලු :-**

| ඉදිරිපත් කළ අය | ගැටලුව | තීරණය | වගකීම | තීරණයට අවශ්‍ය කාලය |
|---|---|---|---|---|
| ගොවි නායකවරු කිහිප දෙනෙකු විසින් | ව්‍යාපාර කමිටුව නිශ්චිත වෙලාවකට නොපැවැත්වීම | ඒ පිළිබඳ දීර්ඝ සාකච්ඡාවකින් පසු පහත සඳහන් තීරණ වලට එළඹිනි. | ව්‍යාපාර කළමණාකරු | |
| | | 01.කමිටු රැස්වීම ආරම්භ කිරීම පෙරවරු 9.00ට<br><br>02.පෙරවරු 9.00ත් 9.30ත් අතර අත්සන් කිරීමට කාළය ලබාදීම | | |

| | | | | |
|---|---|---|---|---|
| | | 03.පෙරවරු 9.30න් පසු අත්සන් කිරීමට නොදෙන බවත් යම් නායකයෙකුට එසේ 9.00න් පසු පැමින කමිටු රැස්වීමේ සිටිය හැකි බවත් එහෙත් අදහස් ප්‍රකාශ කිරීමට අවස්ථාව නොලැබෙන බවත් කමිටුවේ රැඳී සිටීමට අවසර ලබා දෙන බවටත් තීරණය විය.<br>04.කමිටු රැස්වීමට සහභාගීවන අය කමිටුව අවසානය දක්වා රැඳී සිටිය යුතු බවත් එසේ නොසිටින අයගේ ඉල්ලීම් වාර්ථාවට ඇතුළත් නොකරන බවටත් එහෙත් දහවල් 01න් පසු ඕනෑම සාමාජිකයෙකුට තම අවශ්‍යතාවය මුලාසනයට දැනුම් දී කමිටු රැස්වීමෙන් පිටව යා හැකි බවටත් තීරණය විය.<br>05.අවශ්‍ය වුවහොත් කමිටු රැස්වීම සවස 4.00 දක්වා වුව පැවැත්වෙන බවත් එමනිසා මේ පිළිබදව සියලුම ගොවි නායකත්වය දැනුවත් කිරීමට සංවර්ධන නිළධාරීන්ට වගකීම පවරන ලදි. | | |

මෙම තීරණ ගන්නා ලද්දේ ගොවි නායකයින් එක් එක් වේලාවට පිටව යාමත් එසේ කිරීමෙන් කමිටුව ගන්නා ලද තීරණ වලට එය බලපාන බවත් එම නිසා කමිටුව පැවැත්වෙන දිනයේදී වෙනත් කටයුතු යොදා නොගන්නා ලෙසත් එසේ වෙනත් කටයුතු තිබෙන දවසට තම සංවිධානයේ ලේකම් හෝ භාණ්ඩාගාරික කමිටුවට සහභාගී කරවන ලෙසත් කමිටු රැස්වීමට සහභාගී විය හැක්කේ එක් ගොවි සංවිධානයකින් එක් නිළධාරියෙකුට පමණක් බවත් මතක් කර දුනි.

**කිරිදිඹය ඒකාබද්ධ ගොවි සංවිධානයේ නිළවරණය පැවැත්වීම:-**

කිරිදිඹය ඒකාබද්ධ ගොවි සංවිධානයේ නිළවරණය පැවැත්වීම සම්බන්ධව පහත සදහන් තීරණ වලට එළඹිණි.ඒ අනුව ඔක්තොම්බර් 23 දින සවස 2.00ට කිරිදිඹය ඒකාබද්ධ ගොවි සමිති සංගමයේ වීරවිල පොලිසිය අසළ පිහිටි කාර්යාලයේදී පැවැත්වීමටත් ඒ සදහා ප්‍රධාන කාර්යාලයේ නියෝජිත මහතකු සහභාගී කරවීමටත් එම නියෝජිතයාට එදිනට සහභාගී විය නොහැකි වුවහොත් රැස්වීම පැවැත්වෙන දිනයේ වෙනසක් සිදුවිය හැකි බවත් එම රැස්වීමට සහභාගී විය හැක්කේ එක් ගොවි සංවිධානයක සභාපති ,ලේකම් ,භාණ්ඩාගාරික තිදෙනාට පමණක් බවත් ඒ අනුව ව්‍යාපාර කමිටුවේ ගොවි සංවිධාන 62ක් නියෝජිතයින් 186 දෙනකු එම සංගමයේ සාමාජිකත්වය දරන බවත් ඉන් ඕනෑම කෙනෙකුට එහි නිළධාරීන් ලෙස පත්වීමේ හැකියාව තිබෙන බවත් එහි කාර්යභාරය වන්නේ ව්‍යාපාර කමිටුවෙන් ඉටුකර ගත නොහැකි ජාතික මට්ටමේ ගොවි ගැටලු පිළිබදව රජය දැනුවත් කිරීම ගොවි ජනතාවට හානියක් වන යම් යම් තීන්දු වලදී ඒ පිළිබදව අදාළ බලධාරීන් දැනුවත් කිරීම වැනි කරුණු ප්‍රධාන වන බවත් ඒ සම්බන්ධයෙන් විසදා ගත නොහැකි කරුණු ජාතික ඒකාබද්ධ ගොවි සංවිධානයට දැනුවත් කර ගැටලු විසදා ගැනීමට ක්‍රියා කිරීම ජාතික ඒකාබද්ධ ගොවි සංවිධානය යනු අපේ රට තුළ ව්‍යාපාර කමිටු 54ක් තිබෙන බවත් ඒ එක් එක් ව්‍යාපාරයට විවිධ නම් වලින් ඒකාබද්ධ ගොවි සංවිධාන පිහිටුවා ඇති බවත් එම එක "එක් ව්‍යාපාර අයත් දිස්ත්‍රික්කවල ජාතික ඒකාබද්ධ ගොවි සංවිධානයේ දිස්ත්‍රික්ක සංවිධාන පිහිටුවා ඇති බවත් ඒ අනුව හම්බන්තොට දිස්ත්‍රික්කයට අදාළව ව්‍යාපාර ගොවි සංවිධාන තුනක් තිබෙන බවත් ඒ අනුව කිරිදිඹය ව්‍යාපාරය, රිදියගම ව්‍යාපාරය, මුරුතවෙල ව්‍යාපාරය ලෙසත් එම ව්‍යාපාර තුනෙන් එහි සභාපති ,ලේකම් ,උප සභාපති ,උප ලේකම් ,භාණ්ඩාගාරික යන අය දිස්ත්‍රික් සංවිධානයේ සාමාජිකත්වය දරන බවත් ඒ අනුව ඔවුන්ගේ ප්‍රධාන නිළ තුනෙන් පස් දෙනෙකුට දිස්ත්‍රික් කමිටුවේ සභාපති ,ලේකම් ,භාණ්ඩාගාරික උප ලේකම්, උප සභාපති වියහැකි බවත් වර්තමානයේ හම්බන්තොට දිස්ත්‍රික් සංවිධානයේ ගරු සභාපති වන්නේ අප ව්‍යාපාරයේ නියෝජිතයකු වන උපාලි අරඹගේ මහතා බවත් දිස්ත්‍රික් සංවිධානයේ ප්‍රධාන නිළධාරීන් පස්දෙනා ජාතික ඒකාබද්ධ ගොවි සංවිධානය නියෝජනය කරන බවත් ජාතික ඒකාබද්ධ ගොවි සංවිධානයේ ප්‍රධාන නිළධාරීන් වන්නේ එම දිස්ත්‍රික් ගොවි සංවිධානවල ප්‍රධාන නිළධාරීන්ගෙන් පස් දෙනෙකු බවත් එම නිළවරණයද අවුරුදු දෙකෙන් දෙකට පවත්වන බවත් වර්තමානයේ ජාතික ඒකාබද්ධ ගොවි සංවිධානයේ ගරු සභාපති වන්නේ මිනිපේ ගොවි ජනපද ව්‍යාපාරයේ ගරු සභාපති වන ඒ. පී. වී .පී. එස් .ගමගේ මහතා බවත් ලේකම් වන්නේ රාජාංගන ගොවි ජනපද ව්‍යාපාරයේ සාගර වන්නි ආරච්චි මහතා බවත් භාණ්ඩාගාරික වන්නේ රිදියගම ව්‍යාපාරයේ සහති ශෂී එදිරිසූරිය මහතා බවත් සදහන් කරන ලදි.

**සිරි දළදා යල් රන් අස්වනු මංගල්‍ය පූජාව:-**
සිරි දළදා යල් රන් අස්වනු මංගල්‍ය පිළිබඳව කලින් කමිටුවේදී යෝජනා කරගත් පරිදි එක් ගොවි සංවිධානයකින් රුපියල් දහසක මුදලක් ව්‍යාපාර කළමණාකරන මුලස්ථානයට යැවීම සඳහා ලබාදෙන ලෙසත් මේ වන විටත් රුපියල් තිස් පන් දහසක් ලැබී ඇති බවත් එක් ගොවි සංවිධානයකින් ලබාදෙන සහල් හා පොල් ප්‍රමාණය තම ගොවි සංවිධානය අධීක්ෂණය කරන සංවර්ධන නිළධාරීන්ට ලබා දෙන ලෙසත් ඒ අනුව එම සහල් හා පොල් එදිනම රැගෙන යාම සඳහා අවශ්‍ය ලොරි රථයක් ලබා ගැනීමටත් ඇල්ලගල උප කමිටුව මගින් බස් රථයක් ලබා ගැනීමට තීරණය කර ඇති බවත් දකුණු ඉවුර වම් ඉවුර ගොවි නායකයන්ද එම බස් රියේ රැගෙන යාමට හැකි බවත් දැනුම් දුනි.එක් ගොවි සංවිධානයකට ගොවි සංවිධානයේ නිළධාරීන් දෙදෙනෙකු සඳහා ගමන් වියදම් ලෙස රුපියල් දෙදහසක (රු:2000/-) ගොවි සංවිධාන අරමුදලින් ලබා ගැනීමට අනුමැතිය ලබා දෙන ලදි.

**අධ්‍යයන චාරිකාව:-**
**2017** වර්ෂයේ අධ්‍යයන චාරිකාව ඔක්තොම්බර් මස 10 ,11, 12 ,13 යන දින 4දී යාමට තීරණය කළ බවත් ඒ සඳහා බස් වලට ගමන් ගාස්තු ව්‍යාපාර කළමණාකරන මුලස්ථානයෙන් ලැබෙන බවත් ගොවි නියෝජිතවරුන්ගේ වියදම් ලෙස රුපියල් 1500ක් ලබා ගන්නා බවත් ඉන් රුපියල් 1000ක් කලින් ලබාදෙන ලෙසත් සෑම ගොවි සංවිධානයකම සභාපති ,ලේකම් ,භාණ්ඩාගාරික යන තුන් දෙනාගෙන් නිළධාරි දෙපළකට සහභාගී විය හැකි බවත් එසේ සහභාගී නොවන ගොවි සංවිධාන වලින් වෙනුවට කාරක සභාවේ නියෝජිතවරුන්ට සහභාගී විය හැකි බවත් එසේත් සහභාගි නොවන්නේ නම් චාරිකා කමිටුවට එම පුරප්පාඩු පිරවීමේ බලය ලබාදෙන බවටත් තීන්දු කරන ලදි.චාරිකාව පිටත් වෙන වේලාව 10 වෙනිදා අලුයම 5.00ට බවත් තිස්සමහාරාම විහාරය ළගට උදේ 4.30ට පැමිනෙන ලෙසත් දකුණු ඉවුර ගොවි මහත්වරු වීරවිල හන්දියට පැමිනෙන ලෙසත් තිස්සමහාරාම සේනානායක මාවතේ පිහිටි පැරකුම් ගොවි සංවිධානයේ සභාපති කේ.පී ඥාණදාස මහතාගේ නිවසට ලෙස ස්ථාන දෙකක් නම් කරන ලදි. චාරිකාවට සහභාගී වන සෑම ගොවි නියෝජිතයකුම චාරිකා කමිටුවේ ගොවි නායකයන්ට අවනත වියයුතු බවත් ආහාර පිසීමේ කටයුතු වලට නායකත්වය දීමට ආහාර කමිටුවක් පත්කළ අතර ඔවුන්ට සහය වීමට අනෙක් අයටත් උපදෙස් ලබා දුනි.චාරිකා කමිටුවේ සාමාජිකයින් ලෙස උපාලි අරඹගෙ," එස්, ජාලියගොඩ ,එස්. ටී .යු රංජිත් ,ඊ .ඒ විමලරත්න ,ඩී අන්දරවීර ,චමින්ද රොෂාන් ,එම්. එම් මුණසිංහ ,සිරිපාල මහතා නම් කරන ලදි.ඉන් කමිටු සභාපති ලෙස උපාලි අරඹගේ මහතාත් භාණ්ඩාගාරික ලෙස එස් .ජාලියගොඩ මහතාත් නම් කරන ලදි.

ව්‍යාපාර කළමණාකරන මුලස්ථානයේ අධ්‍යක්ෂක තුමිය විසින් එවන ලද ලිපියට අනුව පැෂන් නම් වගාව සඳහා අක්කර භාගයක් ගානේ වගා කිරීම සඳහා සංවිධාන වලින් ගොවීන් තෝරා දෙන ලෙස ව්‍යාපාර කළමණාකාරතුමා දැනුම් දෙන ලදි.

ක්ෂමා ආයතනයෙන් ගොවීන් 20ක් පර්යේෂණ ගොවිපල කිරීම සඳහා ලබා දෙන ලෙස දන්වා ඇති බවත් ඒ සඳහා ගොවීන් 20ක් තෝරා දෙන ලෙස දැනුම් දුනි.එම අවසථාවේදී සරත් ලියනගම ,අතුල ගලප්පත්ති, පී. පී සෝමවංශ, සරත් සිරිවිජය ,උපාලි අරඹගේ , එස් .ජේ .යු රංජිත් ,එම් .ඒ චන්ද්‍රසේන ,ටී. එම් මහින්ද ,එම් .සී .අප්පු සිඤ්ඤෝ, කේ .පී ජයදාස, පී .ඒ රත්නසිරි ,පී .පී අමරවංශ මහතා යන අයගේ නම් ඉදිරිපත් කළ අතර ඉතිරි අය ගොවි සංවිධානවලින් තෝරා දෙන ලෙස ඉල්ලා සිටින ලදි.

වීරවිල ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ පෝෂණ කමිටුව මගින් සංවිධානය කරන ලංකාවේ දේශගුණික විපර්යාසයන්ට අනුව ඉදිරි වගා කටයුතු සැළසුම් කරන අයුරු උපදෙස් දෙන වැඩමුලුවක් සංවිධානය කර ඇති බවත් ඒ සඳහා වීරවිල ගොවිජනසේවා බල ප්‍රදේශයට අයත් ගොවීන් 50ක්ද යෝධකණ්ඩිය ගොවිජනසේවා බල ප්‍රදේශයට අයත් ගොවීන් 50ක්ද ලෙස සහභාගී කරවීමට දින දෙකක් ලබාදෙන ලෙස දැනුම් දී ඇති බව වීරවිල වැව් කමිටු නායක උපාලි අරඹගේ මහතා දැනුම් දෙන ලදි.ඒ අනුව වීරවිල ගොවිජන බලප්‍රදේශය ඔක්තොම්බර් 16 දින උදේ 9.00ටත් යෝධකණ්ඩිය ගොවිජනසේවා බලප්‍රදේශයට නොවැම්බර් 19 දිනත් ලෙස දින යොදා ගන්නා ලදි.දකුණු ඉවුර බදගිරිය කුඹුරු වගා නොකිරීමට වගා වන්දි ලබාදීම පිළිබඳව සාකච්ඡා කරන ලදි.ඒ පිළිබඳ දිස්ත්‍රික් කෘෂිකර්ම කමිටුවට ඉදිරිපත් කිරීමට යෝජනා විය.

**ටොම් .ඊ. ජේ .සී අඹ වගාව:-**
මෙම වගාව පිළිබඳව වගා කරුවන්ට අදාළව කමිටු 5ක් පත්කර ඇති බවත් එම කමිටුවල මාසික වාර්තා ඉදිරිපත් කිරීමට වම් ඉවුර සංවර්ධන නිළධාරී සේනාරත්න මහතාට වගකීම පවරන ලදි.

**වාරිමාර්ග දෙපාර්තමේන්තුව:-**

තිස්සමහාරාම වාරිමාර්ග කාර්යාලයේ ප්‍රාදේශීය සහකාර ප්‍රසාද් මහතා අදහස් දක්වමින් මෙදින කමිටුවට වාරිමාර්ග ඉංජිනේරුතුමාට සහභාගී වීමට නොහැකි බවත් එතුමා විශේෂ රැස්වීමකට සහභාගී වී ඇති බවත් දැනුම් දෙමින් පළමුව ජලාශවල ජල තත්ත්වය පැහැදිලි කරන ලදි.ඒ අනුව

| | | |
|---|---|---|
| ලුණුගම්වෙහෙර | - අක්කර අඩි 20552 | - අඩි 154.5 |
| වෙහෙරගල | - අක්කර අඩි 5626 | - අඩි 276.7 |
| වීරවිල වැව | - අක්කර අඩි 3450 | - අඩි 5.7 |
| තිස්ස වැව | - අක්කර අඩි 1225 | - අඩි 11.2 |
| යෝධවැව | - අක්කර අඩි 550 | - අඩි 4 |
| බදගිරිය වැව | - අක්කර අඩි 1200 | - අඩි 7.9 |

ලෙස සඳහන් කරමින් වාරිමාර්ග ගැටලු ඉදිරිපත් කිරීමට අවස්ථාව ලබාදුනි.

**වාරිමාර්ග ගැටලු:-**

| ඉදිරිපත් කළ අය | ගැටලුව | තීරණය | වගකීම | තීරණයට අවශ්‍ය කාලය |
|---|---|---|---|---|
| ව්‍යාපාර කළමණාකාරතුමා | වැලි ගොඩ දැමීම සම්බන්ධව වාරිමාර්ග ඉංජිනේරුතුමා විසින් ප්‍රාදේශීය ලේකම්තුමාට යවන ලද ලිපිය කමිටුවට ඉදිරිපත් කරන ලදි. | උපාලි අරඹගේ මහතා අදහස් දක්වමින් මේ පිළිබඳව දිස්ත්‍රික් කෘෂිකර්ම කමිටුවේදී විරෝධය පළ කළ බවත් එසේ වැලි ගැනීමට ඉඩ දිය නොහැකි බව ප්‍රකාශ කළා. | | |
| එස්. ජාලියගොඩ මහතා | යෝධවැවේ ජල මට්ටම අඩුවීම | ප්‍රාදේශීය සහකාර ප්‍රසාද් මහතා පිළිතුරු දෙමින් ජේ .සී .බී යන්ත්‍රයක් යොදා යෝධවැව ආසන්නයේ පුද්ගලයකු වගාවන් සඳහා ජලය ලබාගෙන ඇති බවත් මේ වනවිට එම පුද්ගලයා හඳුනාගෙන ඇති බවත් ඔහුට විරුද්ධව නීත්‍යානුකූල පියවර ගන්නා බව සඳහන් කළා.තව දුරටත් අදහස් දැක්වූ එතුමා ප්‍රකාශ කළේ දකුණු ඉවුර වම් ඉවුර සාර්ථක කර ගැනීමට අභියෝගයට මුහුණ දුන් බවත් 95ක් ජයග්‍රහන අත්කරගත් බවත් අස්වනු අඩුවීම සිදුවී ඇති බවත් ඉල්ලා ඇති ජල දිගුව සම්බන්ධව අදහස් ප්‍රකාශ කරමින් අද්දින ලැබුණු වර්ෂාව එය ඉදිරියට ගෙන යා හැකි බවත් සඳහන් කරමින් බදගිරියට කෝටි 9ක වාරිමාර්ග සංවර්ධන කටයුතු සිදු කරන බවත් එම මුදල් වාරිමාර්ග හා ජල කළමණාකරන අංශය මැදිහත් වී ලබාගත් බවත් දකුණු ඉවුරෙන් යාය 7 තෝරාගෙන වාරිමාර්ග ගැටලු විසදන බවත් ඇල්ලගල පද්ධතියට ව්‍යාපෘතියක් ලෙස මූල්‍ය ප්‍රතිපාදන ඉල්ලා ඇති බවත් එහෙත් එයට ප්‍රතිචාර තවම නොලැබී ඇති බවත් ක්‍රිප් ව්‍යාපෘතිය යටතේ යෝධවැව දෙබරවැව තිස්ස වැව යන වැව් සඳහා කෝටි 20ක පමණ | | |

| | | | | |
|---|---|---|---|---|
| | | මුදලින් ප්‍රතිසංස් කරණ කටයුතු කරන බවත් එම ඉදිකිරීම් ගොවි සංවිධාන මට්ටමින් සහ කොන්ත්‍රාත් කරුවන් සම්බන්ධ කරගෙන ඉදිකිරීම් කරන බවත් වීරවිල වැව ඩීසී 13 වැඩ කොටස් කරන බවත් කෝන්වැලෑන අමුණ ඇළ නැදිගම්විල පන්සල පැත්තේ පැති බැම්ම ඉදි කිරීමට අමාත්‍ය මහින්ද අමරවීර මහතා ලක්ෂ 20ක මුදල් ප්‍රතිපාදන එවා ඇති බවත් එය ඉදි කරමින් පවතින බවත් පන්නගමුව ගොවි සංවිධානයට අනුමත වු ප්‍රතිසංස්කරණ වලින් භාගයක් පමණ ඉදි කිරීමට මුදල් ප්‍රතිපාදන ලැබී ඇති බවත් සඳහන් කරන ලදි. | | |
| තිස්ස වැව වැව් කමිටු සභාපති පී.පී සෝමවංශ මහතා | ප්‍රධාන ඇළේ අඩි එක හමාරක පමණ දොරක් අවශ්‍ය බව ප්‍රකාශ කරන ලදි. | ප්‍රාදේශීය සහකාර ප්‍රසාද් මහතා එම ඇළේ ප්‍රතිසංස්කරණ කටයුතු අවසන් නොමැති බවත් කොන්ත්‍රාත් කාළය අවුරුදු 1ක් ඉදිරියට තිබෙන බවත් ප්‍රාකාශ කරන ලදි. | වාරිමාර්ග | |
| කමිටු නියෝජිතවරුන් | තිස්ස වැව තුළ සදුන්ගම පාරට සමාන්තරව භාරන ලද ඇළට සම්බන්ධව ඇති බිම් ප්‍රමාණය අනවසරයෙන් අල්ලා ගැනීම පිළිබදව ප්‍රශ්න කරන ලදි.ඇළ සකස් කිරීම නිසා අනවසර අල්ලා ගැනීම් කළ පුද්ගලයන්ට නීත්‍යානුකූළ අයිතිය ලබා දීමට පියවරක් ගත්තා සේ බව ගොවි නියෝජිතවරු පෙන්වා දෙන ලදි. | | | |
| යෝධවැව වැව් කමිටු සභාපති එස් ජාලියගොඩ මහතා | යෝධවැව ප්‍රධාන ඇළේ වැව් කණ්ඩිය දෙපස විශාල ගස් කපා ඉවත් කිරීමේ ගැටලුව ඉදිරිපත් කරන ලදි | ඒ සදහා යන්ත්‍ර ලබාදීමට නොමැති බව ප්‍රාදේශීය සහකාර නිළධාරීතුමා ප්‍රකාශ කරන ලදි.ප්‍රාදේශීය සහකාර ප්‍රසාද් මහතා අදහස් දක්වමින් වම් ඉවුර සීනුක්කුව ප්‍රතිසංස්කරණ කටයුතු කරන බවත් මෝටර් ගේටර් යන්ත්‍රය මේ දිනවල අලුත් වැඩියා කටයුතු කරන බවත් ඉන්පසු එය වැව්වල ප්‍රතිසංස්කරණ කටයුතු සදහා ලබාදෙන බවත් ප්‍රකාශ කරන ලදි. | වාරිමාර්ග | |
| ගොවි නයෝජිතයින් | ජුල්මුල්ල දෙවන අදියර නෙලුම් ගොවි සංවිධානයේ අව්දිමත් බෝක්කු ඉදි කිරීමේ ගැටලුව සාකච්ඡා කරන ලදි. | එය විසදා ගැනීම ව්‍යාපාර කමිටු ලේකම් ඊ.ඒ විමලරත්න මහතා සමග එහි සභාපති ගුණදාස ජයසේකර මහතා 2017-09-27 දින තිස්සමහාරාම ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ සැළසුම් අධ්‍යක්ෂක තුමා හමුවීමට යාමට තීරණය කරන ලදි. | | |

| | | | | |
|---|---|---|---|---|
| රණකෙළිය ගොවි සංවිධානය | රණකෙළිය පල්ලත්තර ගේට්ටුව ප්‍රතිසංස්කරණය කිරීමට යෝජනා කරන ලදි. | එය ලිපියක් මගින් ඉල්ලීම් කරන ලෙසත් ඉදිරි සැළැස්මට එය ඇතුළත් කළහැකි බවත් ප්‍රකාශ විය. | වාරිමාර්ග | |
| දෙබරහැළ එක්සත් ගොවි සංවිධානයේ සභාපති කේ.පී ජයදාස මහතා | ප්‍රධාන ගේට්ටු දෙකේ දොරළෑලි සවි කිරීම | එය ඉටුකර දෙනබව ප්‍රකාශ විය. | වාරිමාර්ග | |
| වම් ඉවුර උප කමිටු සභාපති ඊ.එම් විමලසිරි මහතා | තම යායට ජලය ලබා ගැනීමේදී ඇතිවූ අපහසුතා පිළිබඳව දැනුවත් කරන ලදි.අස්වැන්න 50%දක්වා අඩුවී ඇති බවත් සඳහන් කරන ලදි. | කන්නයට වගා නොකිරීමෙන් ජලාශයේ ජලය අඩු ප්‍රමාණයෙන් වගා කිරීමේදී එවැනි ගැටලු ඇතිවන බවත් අවධානම ගොවීන් භාරගෙන වගා කළ බවත් සදහන් කරන ලදි. | | |
| වීරවිල වැව ඩීසී 5 ලේකම් අතුල ගලප්පත්ති මහතා | වීරවිල වැවේ නිර්මිත කැඩීම සම්බන්ධව තිස්සමහාරාම වාරිමාර්ග ඉංජිනේරු තුමා සහ හම්බන්තොට දිස්ත්‍රික් වාරිමාර්ග අධ්‍යක්ෂක තමා විසින් එවන ලද එකම කරුණු සම්බන්ධ ලිපි වලට අනුව එවැනි නිර්මිත කැඩීමක් සිදුවී නොමැති බවත් වාරිමාර්ග දෙපාර්තමේන්තුව අදාළ ඉබි යතුරු සහ දොරවල් වසා තැබීමෙන් ගොවීන් විසින් එම ගේට්ටු අරින බවත් වරද ගොවි සංවිධාන මත පවරා නීත්‍යානුකූල කටයුතු කිරීමට ක්‍රියා කිරීම වැරදි ක්‍රියාමාර්ගයක් බවත් ඒ පිළිබඳව වාරිමාර්ග අධ්‍යක්ෂක තුමාට ලිපියක් යවන බවත් දැන්වීය. | ඒ පිළිබඳව අදහස් දැක්වූ ව්‍යාපාර කමිටු ලේකම් ඊ.ඒ විමලරත්න මහතා එම ලිපිය තිස්සමහාරාම වාරිමාර්ග ඉංජිනේරුතුමා එවා ඇත්තේ ඉදිරි සංවර්ධන කටයුතු කිරීමෙන් පසු ගොවි සංවිධානයට එම නිර්මිත රැකබලා ගැනීමේ වගකීමක් යුතුකමක් ලෙස දැනුවත් කිරීමට බවත් එම ලිපි සකස් කිරීමේදී වචනවල අඩුපාඩුකම් නිසා එවැනි අදහසක් ගම්‍ය වන බවත් හම්බන්තොට දිස්ත්‍රික් අධ්‍යක්ෂක තමා ලිපියක් එවා ඇත්තේ නිකරුනේ බවත් වාරිමාර්ග කාර්යාලයෙන් එවැනි ලිපියක් වීරවිල වැව ගොවි සංවිධාන වලට යැවූ බවට දන්වා යම් ලිපියක් එතුමාගේ දැනුවත් වීමට පමණක් යවා ඇති බවත් කෙසේ වෙතත් වාරිමාර්ග අධ්‍යක්ෂකතුමා ව්‍යාපාර කමිටුව කැදවා ගතයුතු බවත් එතුමා පොරොන්දු වූ පරිදි වාරිමාර්ග අධ්‍යක්ෂ තුමා සමග කිරිදිඔය ව්‍යාපාර කමිටුවට දිනයක් මෙතෙක් ලබා නොදීම කොච්චිපතාන වැව විවෘත කිරීමේ උත්සවයට සුභපැතුම් බැනරය සාදාගෙන ගොවීන් එම උත්සවයට සහභාගී වීමට සූදානම් වී සිටියදී ඒ සඳහා ලබා දෙනවා කී බස්රථ ලබා නොදී ගොවීන් අපහසුතාවන්ට පත් කිරීම සම්බන්ධව එතුමා නැවත සුහද සාකච්ඡාවක් පැවැත්වීමටත් ව්‍යාපාර කමිටුවේදී වාරිමාර්ග දෙපාර්තමේන්තුවට ලබාදිය නොහැකි පිළිතුරු වෙනුවෙන් එතුමාගෙන් පිළිතුරු ලබා ගැනීමට අවශ්‍ය බවත් එහිදී ගොවි නායකත්වය පත්වන අසීරුතා මග හරවා ගැනීමට | | |

| | | | | |
|---|---|---|---|---|
| | | උපකාරී වන නිසාත් එතුමාගේ සාකච්ඡාවක් හෝ ඉදිරි ව්‍යාපාර කමිටුවට එතුමා සහභාගී කරවීමට පියවර ගන්නා ලෙස ව්‍යාපාර කළමණාකාර කමිටුවේදී ඉල්ලා සිටින ලදි. | | |
| බදගිරිය අංක 02 ලේකම් ඩී අන්දරවීර මහතා | බදගිරියට වගා රැස්වීමක් ලබා දෙන ලෙසත් තම ව්‍යාපාරය අම්බලන්තොට වාරිමාර්ග කාර්යාලයට සම්බන්ද කිරීමට සාකච්ඡාවක් තිබෙන බවත් බදගිරිය ගොවි නායකත්වය ඊට එකග නොවන බවත් අවශ්‍යවන්නේ නම් තිස්සමහාරාම වාරිමාර්ග කාර්යාලය සමග තව දුරටත් සම්බන්ධවීම බවත් ඊට හේතුව අප ව්‍යාපාරයට ජල හිගයක් ඇතිවූ විට ලබා ගැනීමට තිබෙන අක්කර අඩි 5000 ලබා ගැනීමට හැකි වන්නේ එසේ සිටින විටදී පමණක් බවත් සදහන් කරන ලදි. | ප්‍රාදේශීය සහකාර ප්‍රසාද් මහතා සදහන් කළේ බදගිරිය ව්‍යාපාරයට ජල මාර්ග අවහිර වනසේ ඉදිකර ඇති නව සංවර්ධන ප්‍රදේශ වලට ජලය ලබා ගන්නා ඇනිකට් සියල්ල සාදා නිම කිරීමෙන් පසු අම්බලන්තොට වාරිමාර්ග කාර්යාලයට බදගිරිය ව්‍යාපාරය සම්බන්ධ කිරීමේ යෝජනාවක් තිබෙන බවයි." | | |
| බදගිරිය ගොවි නියෝජිත මුණසිංහ මහතා | අන්දර වැවෙන් පහළ අමුණු පහක් බැද ඇති බවත් එම සුලු වාරි ක්‍රම දැනට මහාවාරි වී ඇති බවත් එහි වාණිජ වගාවන් කරන බවත් වැව් 19ක් දැනට බදගිරිය ව්‍යාපාරයට සම්බන්ධ කර ඇති බවත් තවත් වැව් 3ක් ඉදි කිරීමට තිබෙන බවත් සදහන් කරමින් එය බදගිරිය ව්‍යාපාරයට විශාල ගැටලුවක් වී ඇති බවත් සදහන් කරමින් ජල හිග අවස්ථාවකදී ලුණුගම්වෙහෙර ජලාශයෙන් ලබාදෙන ජලය ප්‍රමාණය ලබාදෙන ලෙස ඉල්ලා සිටින ලදි. | | | |
| වීරවිල වැව් කමිටු සභාපති උපාලි අරඹගේ මහතා | මවිආර සෑදීමෙන් පසු බදගිරිය ව්‍යාපාරය කිරිදිඔය ව්‍යාපාරයට ප්‍රශ්ණයක් නොවූ බවත් එහෙත් පවතින දේශගුණික වෙනස්කම් නිසා වර්ෂා රටාව වෙනස් වීමත් අතුරු ව්‍යාපාර ඉදිකිරීමත් නිසා ගැටලුවක් වී ඇති බව සැබෑවක් බවත් එසේ වෙන් වෙන්න තීරණයක් ගත් බවත් බදගිරිය ව්‍යාපාරය අස්වැද්දීමට ජලය ප්‍රමාණවත් මදිවූ විට කිරිදිඔය ලුණුගම්වෙහෙර ජලාශයෙන් ජලය තිබේනම් | | | |

| | | | | |
|---|---|---|---|---|
| | ජල මුරයක් ලබා දීමට ලුණුගම්වෙහෙර ව්‍යාපාරයේ ගොවීන් විරුද්ධ නොවන බවත් සදහන් කළේය. | | | |

ව්‍යාපාර කළමණාකාරතුමා අදහස් දක්වමින් අම්බලන්තොට වාරිමාර්ග කාර්යාලයට කලාප තුනක් තිබෙන බවත් බදගිරිය කිරිදිඔය ව්‍යාපාරයට සම්බන්ධ කළ හැකි උවත් ඊට උඩ වැව් කිරිදිඔය ව්‍යාපාරයට සම්බන්ධ කළ නොහැකි බව සදහග් කරන ලදි.

**ඉදිරි කන්න රැස්වීම්:-**

ඔක්තොම්බර් 09 දින විශේෂ ව්‍යාපාර කමිටුව කැදවා ඒ පිළිබද තීන්දු ගැනීමට කමිටුව ඒකමතිකව එකගතාවය පල කරන ලදි.

**වෙනත්:-**
වීරවිල වැව ඩීසී 04 සභාපති රංජිත් මහතා:-
වීරවිල වැව වනජීවී දෙපාර්තමේන්තුවට අයිතිද යන්න ප්‍රශ්න කරන ලදි.
එහි කුරුලු අභයභූමියක් තිබෙන බව සදහන් විය.
දෙබරවැව ගොඩදොර සුහද සභාපතිතුමා ප්‍රධාන ඇළ සුද්ධ කර දෙන ලෙස යෝජනා කරන ලදි.
යෝධවැව විහාරමහාදේවිපුර ගොවි සංවිධානයේ භාණ්ඩාගාරික රණපාල මහතා කිරිදිඔයට ජලය ලැබෙන ජල මාර්ගයක් උමාඔය ඉදිකිරීම නිසා ගිලා බැස ඇති බව සදහන් ප්‍රවෘත්තිය සම්බන්ධව ප්‍රශ්න කරන ලදි.

ඊට පැහැදිලි උත්තරයක් නොලැබුණ අතර එවැනි සිද්ධියක් තිබෙන බව පමණක් සදහන් විය.
ප්‍රාදේශීය සහකාර ප්‍රසාද් මහතා අවසන් වශයෙන් වාරිමාර්ග ගැටලු පිළිබද පැහැදිලි කිරීම් අවසන් කරමින් ඉදිරි කන්නය සදහා ඇළවේලි සුද්ධ කිරීමට අවශ්‍ය යන්ත්‍ර ලබාදීම තම අධීක්ෂණය යටතේ සිදු කරන බවත් මෙම කන්නයේ කුලී පදනම මත යන්ත්‍ර ලබාදීමට කාර්යාලයට මුදල් ප්‍රතිපාදන නොමැති බවත් සදහන් කරන ලදි.

වීරවිල වැව් කමිටු සභාපති උපාලි අරඹගේ මහතා අදහස් දක්වමින් ප්‍රාදේශීය සහකාර නිළධාරීතුමා දක්ෂ නිළධාරීවරයකු බවත් පසුගිය කන්නය සාර්ථක කර ගැනීමට එතුමාගේ සේවය උපකාරී වු බවත් පසුගිය කන්නය සාර්ථකවීම් අසාර්ථකවීම් දෙකම තිබුණ බවත් වැසි ආරම්භ වන විටම කුඹුරු වගා කිරීම ආරම්භ කිරීමෙන් ජල ගැටලුවට විසදුම් ලබා ගත හැකි බවත් එසේම කන්නයට වගා කිරීම සාර්ථක වන බවත් සදහන් කරන ලදි.

ඉන් අනතුරුව  ව්‍යාපාර කළමණාකාරතුමා විසින් පැමිණි රාජ්‍ය නිළධාරීන්ටත් ගොවි නියෝජිතවරුන්ටත් ස්තුති කරන ලදි.

ඉන් පසු ව්‍යාපාර කමිටු ලේකම්තුමාගේ ස්තුති කථාවෙන් අනතුරුව කමිටුව සවස 2.00ට පමණ නිමා කරන ලදි.

| | |
|---|---|
| ටී.කේ.සුනිල් | ඊ.එම් විමලරත්න |
| නේවාසික ව්‍යාපෘති කළමණාකරු | ගරු ලේකම් |
| කිරිදිඔය මහා වාරිමාර්ග ව්‍යාපාරය | |

පිටපත්:-

1 අධ්‍යක්ෂ,වාරිමාර්ග කළමණාකරණ අංශය - (කාːදැːස)
2 දිස්ත්‍රික් කෘෂිකර්ම අධ්‍යක්ෂ ,හම්බන්තොට - (කාːදැːස)
3 නියෝජ්‍ය කෘෂිකර්ම අධ්‍යක්ෂ,(අන්තර් පලාත්)හම්බන්තොට - (කාːදැːස)
4 ප්‍රාදේශිය ලේකම්/තිසසමහාරාම/ලුණුගම්වෙහෙර/හම්බන්තොට - (කාːදැːස)

5 කලාප වාරිමාර්ග අධ්‍යක්ෂ,(දකුණු කලාපය) - (කා:දැ:ස)
6 වාරිමාර්ග ඉංජිනේරු,තිස්සමහාරාම - (කා:දැ:ස)
7 සහකාර අධ්‍යක්ෂ ,කෘෂි රක්ෂණ මණ්ඩලය - (කා:දැ:ස)